# පසයි ගොවිතැනයි

1. දැන වෙළඳම නොදනි නම්     ගොවිතැනය
යනුවෙන් පෙරදී කිදේ දැන්     වැරදිය
ගොවිතැන නොදැන කලහොත් නම්     ජරමරය
විමසා බැලිය යුතු කල දැන්     එළඹිය

2. මිනිසා ලෙඩ උවොත් යයි දොස්තර     ළඟට
කල යුතු සියළු දේ කරනට     පිළිවෙලට
ලේ මුත්‍රා බලවා ගෙන වැඩි     හොඳට
රෝගයේ නිධානය දැන ගයි ඇති     ලෙසට

3. කෙත් වතු වවන්නේ පොළවේ පස්     වලය
පස ගැන හොඳින් දැන ගොවිතැන් කල     යුතුය
බෝගය වැඩිමට පෝෂක එය     සතුය
එහි අඩු වැඩිය මැනවින් දැන ගත     යුතුය

4. පස් විශ්ලේෂණය සඳහා     යොමුවන්න
උපදෙස් පතා කෘෂි නිළධර     හමුවන්න
ඔබ සතු ගොවි බිමෙන් පස් පිඩුවක්     ගන්න
විස්තර කියා එය ඔවුනට     පවරන්න

5. වවනා බෝගයට නිසි උපදෙස්     සමඟ
අඟනා වාර්තා පෙන්වයි නියම     මඟ
මුදලුත් පිරිමසා අස්වනු වැඩෙන     රඟ
දුටුවිට පෙනෙයි දැන ගොවිතැන උචිත     වග

6. ගොවි මහතුනේ මේ ටික සිහියට     ගන්න
යල මහ හොඳින් දැන ගොවිතැන්     අරඹන්න
පස සැකසීම මැනවින් ඉටු     කරලන්න
නියමිත පොහොර නියමිත කල     සපයන්න

7. ඔබ හිතු මනාපෙට ගොවිතැන් කරන     විට
ලතවෙන්න වේවි අස්වනු නෙලන     විට
පොඩි ඉඩමකින් සරු අස්වනු ලැබ     ගන්ට
ඔබ යා යුතුය නව තාක්ෂණ ක්‍රම     වෙතට

ඒ.ඒ. යසවර්ධන
පර්යේෂණ නිලධාරී
ස්වාභාවික සම්පත් කලමණාකරන මධ්‍යස්ථානය
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.